# භරත නාට්‍යම්හි නවනළු රසය

අංජනා මුතුමාලි කහපලආරච්චි[1]

භාරතයේ පවතින නර්තන සම්ප්‍රදායන් අතරින් පැරණිතම නර්තන සම්ප්‍රදාය ලෙස පිළිගන්නා භරත නාට්‍යම් සම්ප්‍රදායය කාන්තාවන් සඳහා ම සුවිශේෂ වූ නර්තන සම්ප්‍රදායයකි. විද්වතුන්ට අනුව "භරත" යන නාමය යෙදී ඇත්තේ භාව, රාග, තාල යන මූලික සිද්ධාන්ත පදනම් කොටගෙන මේ නර්තනය නිර්මාණය වී ඇති නිසා එකී පදයන්ගේ ප්‍රථම අක්ෂර තුන එක් වීමෙනි. භරත නාට්‍යම් මුළුමනින් ම ආගමික පදනමක් මත නිර්මාණය වූවකි. මෙහි මුඛ්‍යාර්ථය වන්නේ පූජාව යි. මෙකී නර්තනය අතීතයේ දී දෙවියන් ඉදිරියේ රඟ දැක්වීම සඳහා දෙවියන් වෙනුවෙන් කැප වූ කන්‍යාවන් නොහොත් දේවදාසින් නම් පිරිසක් සිටි බවත් කියැවේ. භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි එන නෘත, නෘත්‍ය, නාට්‍ය යන තෙවැදෑරුම් ක්‍රමවේදයන් භරත නාට්‍යම්හි අන්තර්ගත වේ. භරත නාට්‍යම් සම්ප්‍රදායය අද්‍යතනයේ පවතින ක්‍රමානුකූල පිළිවෙළ සකස් කිරීමේ ගෞරවය හිමි වන්නේ චින්නයියා, පොන්නයියා, වඩිවේලු, ශිවනාදන් යන සහෝදරයන් හතර දෙනාට ය. මොවුහු "තාන්ජාවූර් සහෝදරයන්" ලෙස හැඳින්වෙති. මෙකී නර්තනයේ එන අංග ලෙස පුෂ්පාඤ්ජලී, අලාරිප්පු, ජෙතිස්වරම්, වර්ණම්, තිල්ලානා සහ පදම් ආදිය පෙන්වා දිය හැකි ය. මීට අමතර ව ජාවලී, කීර්තනම් ආදි අංග ද වේ. මේ සඳහා යොදාගනු ලබන්නේ දකුණු ඉන්දියානු කර්ණාටක් සංගීතය යි. එහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස "මෘදංගය" නැමැති බෙරය භාවිත කෙරෙයි. මෙහි දී තාල තැබීම සඳහා යොදාගනු ලබන්නේ "නටුවාංගම්" නැමැති තාලම්පට වැනි භාණ්ඩයකි. මෙහි වස්ත්‍රාභරණ නර්තන ශිල්පිනියන්ට එක් ආකාරයක් වන අතර නර්තන ශිල්පීන්ට එයින් මදක් වෙනස් වෙයි. මේ නර්තන සම්ප්‍රදායයේ එන අංග රඟ දැක්වීම සඳහා නවනළු රසය, අසම්යුක්ත හස්ත මුද්‍රා, සම්යුක්ත හස්ත මුද්‍රා සහ ආංගික, ආහාර්ය, වාචික, සාත්වික යන අභිනය ද යොදාගනු ලැබේ. මෙකී සතර අභිනයන් මාධ්‍ය කොටගනිමින් කිසියම් කතා පුවතක්, සිද්ධියක් හෝ අවස්ථාවක් විස්තර කෙරේ. ශෘංගාර, බීභත්ස්‍ය, හාස්‍ය, රෞද්‍ර, අද්භූත, කරුණ, වීර, ශාන්ත සහ භයානක යන නවනළු රසය භරත නාට්‍යම්හි අංග රඟ දැක්වීමේ දී කෙබඳු ආකාරයකින් යොදාගන්නේ ද යන්න පිළිබඳ ව විමසාබැලීම මෙහි අරමුණ යි. මෙහි ඇති වැදගත්කම වන්නේ වර්තමානය වන විට භරත නාට්‍යම් සම්ප්‍රදායය ශ්‍රී ලංකාවේ කොළඹ, මහනුවර සහ යාපනය යන ප්‍රදේශවල ප්‍රචලිත ව පැවතීම යි.

**ප්‍රමුඛ පදඃ** භරත නාට්‍යම්, සම්ප්‍රදායය, නර්තනය, නවනළු රසය

[1] හින්දී අධ්‍යයනාංශය